# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය
## (සංස්ථාගත කිරීමේ)

**මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පොන් සෙල්වරාසා මහතා විසින් 2013 ජුනි මස 06 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 මැයි මස 27 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

**[247 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007328—750 (2013/06)

## මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය (සංස්ථාගත කිරීමේ)

### මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය යන නමින් හඳුන්වන සංගමයක් එකී සාමාජිකයන් විසින් පිළිගන්නා ලද නීතිරීතිවලට අනුව කියන ලද සංගමයට සම්බන්ධ සියලුම කාර්යයන් ප්‍රයෝජනවත් ආකාරයෙන් ඉටු කර ගැනීමේ අරමුණෙන් සහ එකී විවිධ ප්‍රතිපත්ති සපුරාලීමටත් ;

තවද, අදාළ සංගමය ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කර ඇති නිසාත්, එම අයදුම අනුමත කිරීම මහජනතාවට සෙතක් වෙන නිසාත්, එබැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය පහත සඳහන් පරිදි පනතක් ලෙස සම්මත වෙයි :—

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2013 අංක ..... දරන මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය සංස්ථාගත කිරීම.*

**2.** මෙම පනතේ ආරම්භයේ සිටත් ඉන් පසුවත් (මින් පසු ‘‘සංගමය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමයේ වර්තමාන සාමාජිකයන් බවට පත්ව ඇති හෝ මෙයින් ස්ථාපිත කරනු ලබන සංස්ථාවට මින් පසු බඳවා ගනු ලබන්නා වූ සියලුම පුද්ගලයන් (මින් පසු ‘‘සංස්ථාව’’ යනුවෙන් සඳහන් කරනු ලබන) මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය යන නම සහ කිරුළ යටතේ ඉතා බලයලත් ඒකාබද්ධ කණ්ඩායමක විය යුතු ය. තව ද මෙම නම යටතේ සියලුම අධිරණවලත් නඩු ගොනු කිරීමට හැකි බවත් ඊට එරෙහිවත් නඩු ගොනු කිරීමට හැකි ය. පොදු ලාංඡනයක් තබා ගැනීමටත්, පාවිච්චි කිරීමටත් කැමැත්ත, අනුව එම ලාංඡනය වෙනස් කිරීමටත්, සම්පූර්ණ බලය ද, අවසරය ද තිබිය යුතු ය .

2—PL 007189—75 (2013/04)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව ස්ථාපිත කිරීමේ අරමුණ මඩකලපුව තරුණයන් ළමා සමාජය, පොදු ජනතාවගේ ආධ්‍යාත්මික, අධ්‍යාපනික, ශාරීරික, සමාජීය යහපත් ප්‍රවර්ධන කිරීම බව ප්‍රකාශ කර ඇත.

සංස්ථාවේ බලතල.

**4.** මේ පනතෙන් හා වෙනත් ලිඛිත පනත්වල විධිවිධාන අනුව සංස්ථාවේ අරමුණ හෝ එයින් යමක් ප්‍රවර්ධනය කිරීමට හෝ දියුණු කිරීමට අවශ්‍ය හෝ කැමති සියලුම කාර්යයන්, රාජකාරීන් වැඩ කටයුතු කිරීමටත්, ඉටු කිරීමට සංස්ථාවට බලය තිබිය යුතු ය. මෙම බලය තුළින් බැංකු ගිණුම ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම, අවලංගු කිරීමටත්, ඇප මත හෝ ඇප නොමැතිව ණය මුදල් ලබා ගැනීමටත්, එකතු කිරීමටත්, සහනාධාර සහ පරිත්‍යාග ලබා ගැනීමටත්, එකතු කිරීමටත්, එම මුල්‍ය ආයෝජන කිරීමටත්,අවශ්‍ය රාජකාරීන් සහ සේවකයන් කාර්යවල යෙදවීම, පත් කිරීම, ඉවත් කිරීම යන කාර්යයන් සඳහා වූ බලය ද ඇතුළත් වේ.

සංස්ථාවේ කටයුතු කළමනාකරනය කිරීම.

**5.** (1) සංස්ථාවේ නීති රීති අනුව ඒ වෙනුවෙන් සකස් කරන ලද නීති රීතිවල පිළියෙල කළහැකි, ඒ අනුව තෝරාගන්නා ලද එවැනි සාමාජිකයන් සංඛ්‍යාවක් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් සංස්ථාවේ වැඩකටයුතු කළමනාකරණය කළ යුතු ය.

(2) මෙම පනත පටන් ගන්නා දිනට පෙර දින තනතුරේ සිටින අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ පළමුවැනි අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ යම්කිසි රැස්වීමකට සහභාගී වී ඡන්දය පාවිච්චි කරන සංස්ථාවේ නීති රීති අනුව සුදුසුකම් ලබාගත් සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු ප්‍රතිශතයක් ලබාගෙන සංස්ථාවේ අරමුණු ඉටු කර ගැනීමටත්, එහි රාජකාරීන් කළමණාකරනය කිරීම සඳහාත් සංස්ථාවේ මෙම පනතේ හෝ ලිඛිතව ඇති වෙනත් පනතේ විධිවිධානවලට වෙනස් නොවන නීතිරීති කලින් කලට පැනවීම ඊට නීත්‍යානුකූල විය යුතු ය.

(2) මෙම පනත පටන් ගත් දින බලයේ සිටි සමාජයේ නීති රීති ඒවා මෙම පනතේ හෝ වෙනත් ලිඛිතව ඇති වෙනත් පනතේ විධිවිධානවලට නීති රීතිවලට එකඟ නොවන අන්දමට මෙම පනත යටතේ සංස්ථාව විසින් සකස් කරන ලද නීති රීති බව සැලකිය යුතු ය.

(3) සංස්ථාව විසින් පනවන ලද යම්කිසි නීති රීති (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක ආකාරයෙන් සංශෝධන හෝ අවලංගු කළ හැකි ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ නීති රීතිවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

*සංගමය විසින් හෝ සංගමය වෙත ගෙවිය යුතු ණය.*

**7.** මෙම පනත පටන් ගන්නා දිනට පෙර දින සංගමය විසින් ලබාගන්නා ලද සියලුම ණය හා වගකීම් සංස්ථාව විසින් ගෙවා පියවිය යුතු ය. තවද, එම දිනට සංගමය වෙත ගෙවිය යුතු දායක මුදල් මෙම පනත්වල අරමුණ සඳහා සංස්ථාව වෙත ගෙවිය යුතු ය.

*සංස්ථාව මගින් නිශ්චල හා චංචල දේපල තබාගත හැකි ය.*

**8.** සංස්ථාව මිලදී ගැනීම්, සහනාධාර, මරණාධාර මගින් හෝ වෙනත් ආකාරයෙන් එයට අයිතිකර ගනු ලබන නිශ්චල හා චංචල දේපළ කිසිවක් මිලදී ගැනීමටත්, තබාගැනීමටත් සංස්ථාවට නීත්‍යානුකූලව බලය තිබිය යුතු අතර, එම දේපල සියල්ල මෙම පනතේ අරමුණු සඳහාත්, සංස්ථාවේ නීති රීතිවලට අනුකූලව ද ඒවා විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, ඒවා මාරුකර ගැනීමට හෝ වෙනත් ආකාරයෙන් ගනුදෙනු කිරීමට ඇති සම්පූර්ණ බලය තමා සතුව තබා ගත යුතු වේ.

*සංස්ථාවේ මුද්‍රාව.*

**9.** සංස්ථාවේ ලාංඡනය සංස්ථාවේ නීතිරීතිවලට මෙවැනි අනුකූලව සාමාජිකයන් සංඛ්‍යාවක් ඉදිරිපිට නොව කිසිවක් මුද්‍රණය නොකළ යුතු ය. ඔවුන් තමන් පැමිණ සිටි බවට තහවුරු කිරීම පිණිස එම ලියවිලිවල අත්සන් කළ යුතු අතර, එම අත්සන කෙනෙකුට සාක්ෂිකරුවෙක් වශයෙන් අත්සන් තැබීමෙන් වැලැක්වී තිබිය යුතු ය.

*ජනරජයේ හා අනෙකුත් අයගේ අයිතිවාසිකම් රැක ගැනීම.*

**10.** මෙම පනතට ඇතුළත් කර ඇති කිසිවක් ජනරජයේ අයිතිවාසිකම් හෝ යම්කිසි දේශපාලන හෝ සංවිධානය කරන ලද කණ්ඩායමේ අයිතිවාසිකම් හෝ මෙම පනතේ සඳහන් කර ඇති අයත් එම අයගෙන් ඔවුන් මගින් හෝ ඔවුන්ගේ යටතේ අයිතිවාසිකම් කියන අය හැර වෙනත් අයගේ අයිතිවාසිකම් කඩ කිරීම හෝ බලපෑමට ලක් කිරීම නොකළ යුතු ය.

*අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.